

# කස්තිරම

**ඩී බී කුරුප්පු**



# මෙරට වාසී කිවිඳියන් දෙදෙනෙක්

දෙදෙනාම මෙම වසරේ සිය නිමැවුම් රසිකයන් වෙත ඉදිරිපත් කළහ. එක් කිවිඳියක සිංහල රසිකයන්ට ආගන්තුකයෙකු වන්නට බැරිය. කවිය ඔස්සේ නොව සිනමාව ඔස්සේ රසිකයන් ඉදිරියට ආ ඇය 'විරාගය' චිත්‍රපටියේ නිශ්පාදිකා චන්ද්‍රා මල්ලව ආරච්චිය. සිඩ්නි වාසි චන්ද්‍රා මල්ලව ආරච්චි නිව් සවුත් වේල්ස් ප්‍රාන්තය තුළ ද කලා කාරියක ලෙසින් සම්මාන ලබා ඇත. ඇය දක්ෂ චිත්‍ර ශිල්පිනියක් ද වන්නීය. 'පහන' සඟරාවේ ඇගේ චිත්‍ර නිර්මාණ බොහෝවිට දක්නට ලැබේ. ඇය විසින් 'ගැහැනිය' නම් වූ කාව්‍ය නිර්මාණය එළි දක්වන ලද්දේ මේ අවුරුද්ද මුලදීය. කවි හැරෙන්නට ඇය විසින් නිර්මාණය කරන ලද චිත්‍ර ගණනාවක් ද පොතට ඇතුළත්ය.

ප්‍රමිතා රෝහිණි නැමැති අනෙක් කිවිඳිය කැන්බරාවේ වාසය කරන්නීය. හිරුට මුවාවෙන් යන හිසින් ඇය පළ කළ පොතට කෙටි කතා දොළහක් ද ඇතුළත් වෙයි. ඉන් එහාට ඇය ගැන කියන්නට නොදනිමි. ''දියුණු තියුණු කළ භාවේන්ද්‍රිය ඇති කවියෙකුගේ හැකියාව පළකරන ඇගේ කවි වඩා සාර්ථක නිර්මාණ වශයෙන්" දකින බව, පොතට පෙරවදනක් ලියන ගුණදාස අමරසේකර ප්‍රකාශ කරයි.

ස්වභාව සෞන්දර්යය විස්තර කිරීමෙහි ලා ඇය දක්වන හැකියාව ඇගේ කවි ඔස්සේද පිළිබිඹු වන සැටියක් දක්නට ඇත. සැබැවින් ම ඇගේ කවි වැඩි කොටම සොබාදම් වැනුමට යොමු කරපු නිමැවුම් ය. මේ හිරු උදාව ගැන ඇය ලියූ කවක පද කිහිපයකි.

සුළඟේ වෙණතත් තාලෙට මුසු වී
පියවර තබමින් සටනට දිරි දී
රශ්මි කදම්බය දසත ම පතුරා
අඳුර සිඳ බිඳ - සතුරන් ජය ගෙන
ජය කෙහෙළිය නංවා
ජය පැන් බොනවා"

කුණාටුව නමින් වූ කව තව දුරටත් විසිතුරු සිතුවමක් මවන්නකි.

-තැන තැන පැතිරෙන
බිහිසුණු විදුලිය
අහසත් පොළවත්
බිය වද්දා
දැවැන්ත රකුසෙකු ගේ
සරදම් සිනහවක් මෙන්
සියොළඟ කිලිපොලා යවයි

අහස සිසාරා
දිව යන කළු වලා පෙළ
අවි මුගුරු අමෝරා
යුධ වදින
චණ්ඩ සෙබළුන් සේ
තියුණු උල් ඇති
හී සැර වැනි කැට
පොළවට එරෙහිව
බිම මත පතුරයි."

සොබා දම් වැනුමට සපුරා වෙනස් ආකාරයේ හැඟීම් දනවන නිමැවුම් ද මෙම කෘතියෙන් දක්නට ලැබේ. එක් නිදසුනක් මෙසේ ය. එය පසුතැවිල්ල නම් වුවකි.

-මම පව්කාරියක් වුණෙමි.
කුඹල් ගෙය බිඳිලා
අපේ ගෙදර උළුවස්සේ
ඇයි කුඹලෝ ගේ හැදුවේ
ගේ කැඩුවට වඩා දුකයි
පැටවුන් ටික මැරුණ එකයි
සිත වාවා ගන්න බැහැ දෙවියනි
හද කකියනවා
රන් කුඹලෝ
අසරණ මට සමාවෙයන්කො"

චන්ද්‍රා මල්ලව ආරච්චි 'ගැහැනිය' කාව්‍ය සංග්‍රහයෙන් ඊට වඩා නිමැවුම් පුළුල් විෂය පරාසයක් සහිත නිමැවුම් ඉදිරිපත් කරන්නීය. ආදර බඳු සියුම් හැඟීම් මෙන් ම උපහාසය රැගත් කවි ගණනාවක් එම පොතට ඇතුලත්ය. 'විශ්ව සාහිත්‍යයෙන්' යන පොතේ වූ කවිය මෙසේය.

-විශ්ව සාහිත්‍යයේ
වියක් වදනින්
උකහා ගත් සාරයෙන්
දෙසුවෙහිය ඔබ
බහුශ්‍රැතයෙකු සේ

අසා උන්නෙමි
මුව අයා මා
මවිතයෙන්
ඒ විදග්ධ වදන්
එහෙත් මැදි වූ දා
ජීවිතේ ගැටළුවට
කිරි දරුවෙකුය ඔබ
හසරක් නොදත් මම
නොසැලී සිටින්නෙමි
සෙල් පිළිමයක් සේ
එකී බුද්ධිය අභියස"

තවත් එබඳුම කවක් 'පුරාජේරුව' නමින් ලියැවී ඇත. එහි අග කොටස පමණක් උපුටා දක්වමි.

ඉතිහාසය ගැන මහ විරුවන්ගේ
පුරාජේරු ගැන දෙඩුවත් අපි සැම
සිංහලයන්ගෙ එකමුතුකම ගැන
කඳුලක් උපදී නිති දෙනුවන් අග

සිහලුන් අප යැයි කද මුර ගාගෙන
මහවංශය සිරසෙ රඳවාගෙන
සඳකඩ පහණින් සෙබළු වසා ගෙන
සිටියොත් සුරැකේවි ද සිංහල කම"

ගැහැනිය ගැන ඇය ලියන කවකින් ඉදිරිපත් වනුයේ පිරිමින්ට නොපෙනෙන - පෙනුනත් නොතකන පැත්තක් දැයි සිතෙයි. 'නිම්නා' නම් වූ කවෙහි කොටසක් මෙසේය.

මං බිංකුංඩෙකි
පොළව භාරන
අනුන්ට ආවතේව කරන
දරුවන් වදන හදන
එම හිමිකමද පරම්පරාවට ම
මිස තමන්ටවත් නැති
උඩ දමන බිම දමන
අවලංගු කාසියක් ද
ගැහැණිය
කුමක්ද කෙසේද කොතැනද
හිමි තැන
ගැහැනියට "

ගැහැනිය පිළිබඳ තවත් පැත්තක් පොළි කරන්නකි - 'රැකිල්ල' නමින් සැදුනේ මේ එයින් කොටසකි.

නොගොස් එළිපෙහෙළියට කිසි විට
අහු නොවී කොල්ලන්ගෙ දෙනෙතට
වැඩපලක් කර කියා වී ගෙට
රැකුනොත් හොඳයි කල වෙහසට

නීති දහසම දමා ගෑනිට
රකින්නේ ඔය තරම් මොනවට
පිරිමින්ටමයි ඇත්තේ සූ සැට
බලන්නට සලකුණක් නැතිකොට
දෙපා සෝදා ඇගේ නිවසට
මලක් වාගේ රැක්ක දැඩි කොට
බන්දපන් කණ කර දෝනිට.......

මවකගෙ දරුපෙම පිළිබිඹු කරන ඇගේ 'සොරකම' නම් වූ තව සුපුරුදු මතින් වෙනස් වූවකැයි සිතමි. එහෙත් ප්‍රබලය. ඒ කව මෙසේය.

-ඉපදෙන්නටත්
පෙර සිට
දස එකම මසක්
සොරා ගත්තා
මව ඇගෙන්

විසි වසරක්
ගෙවී ගියත්
මේ සොරකම
නිමාවක් ගැන
දැනෙයි සිතට
ජීවිතයෙන්
පරාසයක් නුඹ

උදුරාගත හැකි බව
බලා සිටිමි
සොරා නැසීමට
එකම සක
විනාඩියක්
නුඹ එනතුරු




**ELDERS HOME
IN SRI LANKA**

ROOMS AVALIABLE
FOR ELDERS IN A HOME
AT NEGOMBO-SRI LANKA.
MANAGED BY A DOCTOR.
SITUATED IN A PEACEFUL
AREA ARE REASONABLY
CHARGED.

***For further details pls contact,***
*Tel - 0094-773752737 (S/L)*
*E mai: gajasinghtilak@sltnet.lk*

**STANHOPE PRINTING**
**FOR OFFSET AND DIGITAL PRINTING**
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243